අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශ
චක්‍රලේඛ : 1993/2

මගේ අංකය : අධ්‍යා.රා.ලේ. 1/1/93
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ,
බත්තරමුල්ල

1993.03.05 දින.

(1) පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
(2) පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
(3) පළාත් භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
(4) අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
(5) පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණකාධිකාරීවරුන්,
(6) කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
(7) විදුහල්පතිවරුන් වෙත,

## මහාමාන්‍ය ඩී. එස්. සේනානායක සමරු දිනයේ දී ජනාධිපති අරමුදලෙන් රුපියල් දහස බැගින් පාසල් සංවර්ධන මණ්ඩල වෙත පිරිනැමීම

මෙම චක්‍රලේඛයේ දක්වෙන උපදෙස් එලෙස ම ක්‍රියාත්මක කළ යුතු බව කරුණාවෙන් සලකන්න.

1.0 1993 මාර්තු මස 22 වැනි දින, පැවැත්වෙන ඉහත සඳහන් උත්සවයට අදාල ව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. දිවයිනේ සෑම පාසල් සංවර්ධන මණ්ඩලයකට ම රුපියල් 1000/- බැගින් වූ චෙක්පත් ජනාධිපති අරමුදලින් ලබා දීම මෙදින සිදු කෙරෙනු ඇත.

1993 මාර්තු මස 09 වැනි දින, තම පළාතට අදාළ චෙක්පත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට බාර දෙනු ලබන අතර, අදාළ ගිණුමේ තැන්පත් කිරීමෙන් පසු තමාට අයත් කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත, 1993 මාර්තු මස 12 වන දිනට හෝ ඊට ප්‍රථම ඔහු විසින් චෙක්පත් බාර දිය යුතු ය.

නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් එම චෙක්පත් තම ගිණුමේ තැන්පත් කිරීමෙන් පසු තම කොට්ඨාශයට අයත් සෑම පාසලක් ම සඳහා 1993 මාර්තු මස 22 වැනි දිනැති රුපියල් 1000/- බැගින් වූ චෙක්පත්, 1993 මාර්තු මස 17 වැනි දිනට හෝ ඊට ප්‍රථම හෝ භාර දිය යුතු ය.

මහාමාන්‍ය ඩී. එස්. සේනානායක ශ්‍රීමතාණන් සිහිවීම් වස් එතුමාගේ විශාල ප්‍රමාණයේ ඡායාරූපයක් සෑම පාසලකට ම ලබා දෙනු ලැබේ.

2.0 උත්සව පැවැත්වෙන විවිධ මට්ටම්:

I. පාසල් මට්ටම :

සෑම පාසලක් ම පාසල් මට්ටමින් ඩී. එස්. සේනානායක සමරුව හා ජනාධිපති අරමුදලින් සියලුම පාසල් සංවර්ධන මණ්ඩල සඳහා රුපියල් 1000/- ක් පිරිනැමීම නිමිත්තෙන් උත්සවයක් සංවිධානය කළ යුතු ය. කොළඹ දී පැවැත්වෙන ජාතික උත්සවය සඳහා විදුහල්පති සහභාගි විය යුතු පාසල්වල ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විදුහල්පති මෙම උත්සවය මෙහෙය විය යුතු ය.

II. කොට්ඨාස මට්ටම:

සෑම කොට්ඨාසයක ම තෝරා ගත් පාසලක දී කොට්ඨාසය වෙනුවෙන් පැවැත්වෙන උත්සවය සිදු කළ යුතු ය. මෙම තෝරා ගැනීමේ දී පාසලේ සංවර්ධනය වෙනුවෙන් දෙමාපියන්, ආදි සිසුන් හා ගුරුවරුන්ගේ වඩා විශාල කැප කිරීමක් කළ පාසල් සංවර්ධන මණ්ඩලයකින් යුතු පාසලක් තෝරා ගැනීම අපේක්ෂා කෙරේ.

III. ජාතික මට්ටම :

ජාතික උත්සවය ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් නිදහස් චතුරශ්‍රයේ දී පැවැත් වේ.

3.0 උත්සව කටයුතු සංවිධානය :

මෙම උත්සවය සංවිධානය කිරීමේ දී පාසල අවට ප්‍රජාව, ආගමික නායකයන්, රජයේ ආයතන හා පොලීසිය ආදී සංවිධානවල සහාය ලබා ගත යුතු ය. උත්සවය සඳහා සිසුන්ගෙන් හෝ දෙමව්පියන්ගෙන් හෝ කිසිම මුදලක් අය නොකළ යුතු ය. උත්සවය සඳහා පාසලේ පැවැත්වෙන සාමාන්‍ය රැස්වීමක් පරිදි පැවැත්විය යුතු ය. අවස්ථානුකූල වන පරිදි දෙමව්පියන්, ආදි සිසුන් හා සුභ පතන්නන්ගේ උපරිම සහභාගිත්වයෙන් යුතු චාම් උත්සවයක් විය යුතු ය.

4.1 කොට්ඨාස මට්ටමේ උත්සවය සඳහා ආරාධිතයන් :

4.1.1 කොට්ඨාසය තුළ තෝරා ගත් පාසලේ පැවැත්වෙන උත්සවය සඳහා පළාතේ ප්‍රධාන ඇමතිගේ හෝ පළාතේ කැබිනට් ඇමතිවරයකුගේ හෝ ව්‍යාපෘති ඇමතිවරයකුගේ හෝ රාජ්‍ය ඇමතිවරයකුගේ හෝ ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුගේ හෝ පළාත් සභාවේ ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයකුගේ හෝ ආණ්ඩු පක්ෂයේ පළාත් සභා මන්ත්‍රීවරයෙකුගේ හෝ ප්‍රධානත්වයෙන් පැවැත්වීම අත්‍යවශ්‍ය ය.

4.1.2 සෑම පළාතක ම කොට්ඨාස අධ්‍යාපන කාර්යාල කිහිපයක් ඇති බැවින්, උත්සවය පවත්වන පාසලේ ඉහත සඳහන් දේශපාලන නියෝජිතයන් අතරින් එක් අයකු ප්‍රධාන අමුත්තා වශයෙන් සහභාගි කර විය යුතු ය.

4.1.3 සහභාගි වන නිලධාරීන්ගේ නාම ලේඛනය - පහත දැක්වෙන නිලධාරීන්ගෙන් එක් අයකු හෝ කිහිප දෙනකු හෝ කොට්ඨාස මට්ටමේ උත්සවයට සහභාගි විය යුතුයි.

- i ප්‍රධාන ලේකම්
- ii දිසාපති
- iii ප්‍රාදේශීය ලේකම් / අතිරේක දිසාපති
  (තමාට අයත් බල ප්‍රදේශයේ කොට්ඨාස උත්සවයට සහභාගී වීම වැදගත් ය.)
- iv පළාත් අධ්‍යාපන ලේකම්
- v පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
- vi අතිරේක පළාත් / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ
- vii කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු
  (තමාට අයත් කොට්ඨාසයේ උත්සවයට සහභාගි විය යුතුයි.)

4.2 පාසල් මට්ටමේ උත්සව සඳහා ආරාධිතයින් :

4.2.1 සෑම පාසලක ම පැවැත්වෙන උත්සවය ඉහත 4 (1) හි සඳහන් ප්‍රභූවරයකුගේ ප්‍රධානත්වයෙන් සිදු කළ යුතු අතර, එසේ නො මැති විටෙක පාසල අයත් ප්‍රාදේශීය සභාවේ ආණ්ඩු පක්ෂයේ සභාපති / සාමාජිකයෙකුගේ ප්‍රධානත්වයෙන් සිදු කළ යුතු ය.

4.2.2 උත්සවය පැවැත්වෙන සෑම පාසලක ම පහත සඳහන් අයට උත්සවයට සහභාගි වීමට අරාධනය කළ යුතු ය.

i පාසල් සංවර්ධන මණ්ඩලයේ සාමාජිකයින්,
ii පාසල් සංවර්ධන සමිතියේ කාරක සභාව,
iii ආදි ශිෂ්‍ය සංගමයේ කාරක සභිකයින්,
iv දෙමව්පියන්, ආදි ශිෂ්‍යයන් සහ සුභ පතන්නන්.

4.3 කොට්ඨාස සහ පාසල් මට්ටමේ උත්සව සඳහා වැඩ සටහන

පෙ.ව. 8.45 - පාසල් ශාලාවේ හෝ අංගනයේ සිසුන් එක් රැස්වීම.
9.00 - ආරාධිත අමුත්තන්ගේ සම්ප්‍රාප්තිය.
9.10 - ප්‍රධාන අමුත්තාගේ සම්ප්‍රාප්තිය.
9.15 - ආගමික වතාවත් සිදු කිරීම.
9.20 - මහාමාන්‍ය ඩී. එස්. සේනානායක ශ්‍රීමතාණන්ට ගෞරව දැක්වීම.
(සපයා ඇති ඡායාරූපය භාවිතා කළ හැකි ය.)
9.25 - පාසල් ගීය.
9.30 - පිළිගැනීමේ කථාව - විදුහල්පති (පාසල් සංවර්ධන මණ්ඩලයේ සභාපති)
9.45 - ප්‍රධාන අමුත්තාගේ දේශනය.
10.15 - ශ්‍රීමත් ජනාධිපතිතුමාගේ පණිවුඩය කියවීම (භාෂා තුනෙන් ම)
10.30 - ප්‍රධාන අමුත්තා විසින් පාසල් සංවර්ධන මණ්ඩලයේ භාණ්ඩාගාරික වෙත රුපියල් දහයේ චෙක්පත ප්‍රදානය කිරීම.
10.35 - ස්තුති කථාව (පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායකයා විසින්)
10.45 - ජාතික ගීය (උත්සව සමාප්තිය)

5.1 විදුහල්පතිගේ කථාව :

පාසල් සංවර්ධන මණ්ඩල සංකල්පය සහ පිහිටුවීම පිළිබඳ ව විදුහල්පති කථාවේ දී ඇතුළත් විය යුතු ය. (මේ සඳහා උපකාර විය හැකි තොරතුරු උපලේඛනයක් මේ සමඟ අමුණා ඇත.)

5.2 ප්‍රධාන අමුත්තාගේ කථාව :

ප්‍රධාන අමුත්තා විසින් මහාමාත්‍ය ඩී. ඇස්. සේනානායක ශ්‍රීමතාණන් අනුස්මරණය කිරීමේ කථාව සිදු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

5.3 ප්‍රධාන ශිෂ්‍යනායක / නායිකාවගේ කථාව :

ප්‍රධාන ශිෂ්‍ය නායක/ නායිකාවගේ ස්තුති කථාවේ දී දෙමව්පියන්, ගුරුවරුන්, ආදි සිසුන් හා සුභ පතන්නන් එකම පවුලක් සේ එකමුතු කරමින් පාසල් ප්‍රජාවගේ ක්‍රියාශීලී සහයෝගය ලබා ගනිමින්, පාසලේ ශීඝ්‍ර සංවර්ධනය අරමුණු කොටගෙන පාසල් සංවර්ධන මණ්ඩල පිහිටුවීම පිළිබඳ ව ස්තුති කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

6.1 <u>වෙක්පත් නිකුත් කිරීම :</u>

I ජංගම ගිණුමක් පවත්වාගෙන යන පාසල් සංවර්ධන මණ්ඩල සඳහා වෙක්පත් ලිවීමේ දී "පාසල් සංවර්ධන මණ්ඩලය........................................................ ම. වි., ම. ම. වි. .................................. ලෙස සඳහන් කරන්න.

II ඉතිරි කිරීමේ ගිණුමක් පවත්වාගෙන යන පාසල් සංවර්ධන මණ්ඩල සඳහා වෙක්පත් ලිවීමේ දී "කළමණාකරු,.......................................................................... බැංකුව, ........................................................................ ම. වි., ම. ම. වි. .................. පාසල් සංවර්ධන මණ්ඩලයේ ගිණුමට බැර කරන්න" ලෙස සඳහන් කරන්න.

7.1 එක් එක් පාසල විසින් තම පාසල් සංවර්ධන මණ්ඩල ගිණුමේ අදාල වෙක්පත තැන්පත් කිරීමෙන් පසු ව, සභාපති (විදුහල්පති), ලේකම්, භාණ්ඩාගාරික විසින් මුදල් ලැබුණු බවට හා තැන්පත් කළ බවට අත්සන් කරන ලද ලිපියක් 1993 මාර්තු 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම හෝ කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයාට යැවිය යුතු ය.

7.2 කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්‍ෂ විසින් අදාල වෙක්පත ලැබුණු බව හා එය තැන්පත් කළ බවට රිසිට් පතක් සහ ඔහු විසින් වෙක්පත් භාර දුන් පාසල්වල ලැයිස්තුවක් හා ඒ බව සහතික කරන ලිපියක් 1993 අප්‍රේල් 15 වැනි දිනට හෝ ඊට ප්‍රථම හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයා වෙත යැවිය යුතු ය.

7.3 ජනාධිපති අරමුදල මගින් සැපයුණු වෙක්පත තමන්ට ලැබුණු බවත්, එය අදාල ගිණුමේ තැන්පත් කළ බවත්, සහතික කරන රිසිට් පතක් පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂ විසින් අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙත 1993. 04. 30 ට පෙර එවිය යුතු ය. ඔහු විසින් වෙක්පත් භාර දුන් තමාට අයත් කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල ලැයිස්තුවක් හා ඒ බව සහතික කරන ලිපියක් ද, ඒ සමග අමුණා එවිය යුතු ය.

8.1 දෙමව්පියන්ගේ, ගුරුවරුන්ගේ, ආදි සිසුන්ගේ හා සුභ පතන්නන්ගේ මනා සහභාගිත්වයෙන් එක් එක් පළාත සඳහා විශිෂ්ටතම දියුණුවක් ලැබූ පාසල් සංවර්ධන මණ්ඩල ලෙස එක් එක් පළාත් අධිකාරීන් විසින් පහත සඳහන් පාසල් තෝරා ගෙන ඇත.

| | | |
|---|---|---|
| මධ්‍යම පළාත | : ගුරුදෙණිය ම. වි., | - මහනුවර |
| | : පල්ලේවත්ත ක. වි., | - හසලක |
| | : ජිනරාජ ම. වි., | - ගම්පොල |
| උතුරු මැද පළාත | : හුරිගස්වැව වි., | - මීගලෑව |
| | : දලුග්ගල වි., | - පදවිය |
| | : නෙළුම්වැව ම. වි., | - දිඹුලාගල |
| | : ගිරිතලේගම ම. වි., | - පොලොන්නරුව |
| උතුරු - නැගෙනහිර පළාත | : මඩවලලන්ද ම. වි., | - අම්පාර |
| | : ඩී. එස්. සේනානායක ම. ම. වි., | - අම්පාර |
| | : කාවන්තිස්ස වි., | - අම්පාර |
| | : සද්ධාතිස්ස ම. වි., | - අම්පාර |
| | : බණ්ඩාරනායක බා. ම. වි., | - අම්පාර |
| | : හින්දු වි., | - ත්‍රිකුණාමලය |
| | : අලිගාර් ම. ම. වි., | - මඩකලපුව |
| | : වවුනියා දෙ. වි., | - වවුනියා |
| වයඹ පළාත | : ශාන්ත බර්නඩෙට් ආ. වි., | - පොල්ගහවෙල |
| | : ගලවැව ම. වි., | - ආනමඩුව |
| | : ජයරාජ ම. වි., | - ගල්ගමුව |

| | | |
|---|---|---|
| සබරගමුව පළාත | : ගනේපල්ල ක. වි., | - යටියන්තොට |
| | : සුමන බා. ම. වි., | - රත්නපුර |
| | : ශාන්ත ජෝශප් බා. ම. වි., | - කෑගල්ල |
| | : බුලත්ගම වි., | - බලංගොඩ |
| දකුණු පළාත | : තංගල්ල බා. ම. වි., | - තංගල්ල |
| | : රාජපක්ෂ ම. වි. | - අහුංගල්ල |
| | : ශාන්ත තෝමස් වි., | - මාතර |
| ඌව පළාත | : වේපස්සාවෙල ම. වි., | - හාලි ඇල |
| | : වැලිමඩ ම. ම. වි., | - බණ්ඩාරවෙල |
| | : යකුන්නාව වි., | - මැදගම |
| බස්නාහිර පළාත | : විහාරමහාදේවි බා. වි., | - බියගම |
| | : බෝම්බුවල ප්‍රා. වි., | - බෝම්බුවල |
| | : ඩී. එස්. සේනානායක වි., | - කොළඹ - 07 |

8.2 1993 මාර්තු 22 වැනි දින උදේ 10.30 ට ශ්‍රීමත් ජනාධිපතිතුමා අතින් ඉහත සඳහන් පාසල් සඳහා රුපියල් 1000/- බැගින් වූ චෙක්පත් පිරිනැමේ. එම පාසල් සංවර්ධන මණ්ඩලවල නියෝජිතයන් පස් දෙනකු (ගුරු, දෙමාපිය, ආදි ශිෂ්‍ය, නියෝජිතයෙකු, ගුහපතන්නා සහ විදුහල්පති) බැගින් 1993 මාර්තු මස 21 වන ඉරිදා පස්වරු 1.00 ට ප්‍රථම බත්තරමුල්ල 'ඉසුරුපායේ' අධ්‍යාපන අමාත්‍ය කාර්යාලයට වාර්තා කළ යුතු ය.

8.3 1993 මාර්තු මස 14 වන දා පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා 'ඉසුරුපායේ' දී පැවැත්වෙන රැස්වීමේ දී පළාත් අධ්‍යාපන ලේකම්වරුන්/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් ඉහත සඳහන් තමන්ට අයත්, පාසල් සඳහා වූ 1993 මාර්තු 22 දින දරණ චෙක්පත් අධ්‍යාපන රාජ්‍ය ලේකම්ට භාර දිය යුතු ය.

9.0 <u>පැහැදිලි කිරීම</u> :

මෙම උත්සව සංවිධානයේ දී යම් පැහැදිලි කිරීමක් පළාත් අධ්‍යාපන ලේකම් / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් අපේක්ෂා කරන්නේ නම් කරුණාකර අධ්‍යාපන රාජ්‍ය ලේකම් ආර්. අයි. වී. අලස් මහතා විමසන්න.
(දුරකථන අංක : 564862 - කාර්යාලය, 698958 - නිවස)

10.0 <u>වැදගත්</u> :

එක් එක් පළාත් අධ්‍යාපන ලේකම්වරුන් / පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් තම කොට්ඨාශ භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් මෙම උත්සව සාර්ථක ලෙස සංවිධානය කරනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ සම්බන්ධයෙන් ඔවුන්ගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කෙරේ.

ආර්.අයි.වී. අලස්
අධ්‍යාපන රාජ්‍ය ලේකම් හා
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

අත්: කළේ: / එම්. ඩී. ඩී. පීරිස්
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය.

# උපලේඛනය

## විදුහල්පතිතුමාගේ කථාව සඳහා මඟ පෙන්වීමක්

1993 පෙබරවාරි මස 24 වන දින එනම්, මීට මසකට පමණ පෙර, පාසල් සංවර්ධන මණ්ඩල පනත පාර්ලිමේන්තුවේ දී සම්මත කරන ලදි. එය තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිසමේ නිර්දේශයක් ඵල ගැන්වීමකි.

පාසල් සංවර්ධන මණ්ඩලයේ අරමුණු වන්නේ :

පළමු ව, දෙමව්පියන්, ගුරුවර ගුරුවරියන්, ආදි ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා පාසල් අවට ප්‍රජාවේ සාමාජිකයන් අතර සුහදතාව හා එකමුතුභාවය තහවුරු කිරීම යි.

දෙවනු ව, පාසල එහි ප්‍රජාව කෙරෙන් හුදකලා හෝ බැහැර හෝ නො වී, ඒ ප්‍රජාව කෙරෙහි සෑම විට ම විවෘත පිළිවෙතක් අනුගමනය කිරීම යි.

තෙවනු ව, පාසල ඒ අවට ප්‍රජාව සමඟ අන්‍යොන්‍ය සුහදතාවෙන් හා සහයෝගී හැඟීමෙන් යුතු ව ප්‍රජාවේ අනන්‍යතාව, පරමාදර්ශ හා අභිලාෂ පෝෂණය කරන, සාක්ෂාත් කරන, කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම යි.

පාසල් සංවර්ධනය සඳහා අවශ්‍ය වන අරමුදල් අඛණ්ඩ ව රජයෙන් සපයන බවට, ජනාධිපති හා අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ඇමතිතුමා ප්‍රතිඥා දී ඇත. පාසල් සංවර්ධන මණ්ඩලවලින් අපේක්ෂා කරන්නේ මේ රටේ 42 ලක්ෂයක් වන ආදරණීය දරුවන්ගේ නාමයෙන් මෙම අරමුදල්වලින් උපරිම ප්‍රයෝජනය ගැනීමත් නාස්තිය වලකාලීමත් ය. අප සියලු දෙනාට එක් ව, නිදහස් අධ්‍යාපනයේ [illegible]ාවරයාණන් වූ දිවංගත ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමාණන්ගේ අභිලාෂයන් පෝෂණය කර ශක්තිමත් කළ හැකි වන්නේ එවිට යි.

අපගේ පාසල රැක බලා ගැනීම සඳහා අත්වැල් බැඳ ගෙන කැපවෙමු. අප ජාතියේ පියාණන් වූ මහාමාන්‍ය ඩී. එස්. සේනානායක මැතිතුමාණන්ගේ 41 වන ගුණානුස්මරණ දිනයේ දී අප කරන මේ උදාර අධිෂ්ඨානය එතුමාගේ ශ්‍රී නාමයට උපහාරයක් වේවා !